# 1 ශුද්ධ බයිබලය



1.1 රූපය - ශුද්ධ බයිබලය

අක්කා :- ඔයා දන්නවාද මල්ලී, ලෝකයේ වැඩි ම භාෂා ගණනකට පරිවර්තනය කරලා තියෙන පොත මොකක් ද කියලා?

මල්ලී :- අපොයි! ඔව්, බයිබලයනේ.

අක්කා :- හා! හා! එහෙම කියන්න එපා. බයිබලය කියන්නේ **ශුද්ධ ග්‍රන්ථයක්.** එය කිතුනු අපේ **පූජනීය ග්‍රන්ථය** යි. අපි එයට කියන්න ඕනේ **ශුද්ධ බයිබලය** කියල. එහි **දේව වචනය** අඩංගු වෙලා තියනවා. එම නිසා අපි ශුද්ධ බයිබලය ගෞරවාන්විත ව තැන්පත් කරන්න ඕනේ; ඒ වගේ ම අත් දෙකෙන් ම අරගෙන දෙන්නත් පුරුදු වෙන්න ඕනේ.

මල්ලී :- එතකොට ශුද්ධ බයිබලය පොත් රාක්කේ තියන්නේ නැද්ද අක්කේ?

අක්කා :- ඔව් මල්ලී, අපි වෙනත් පොතක්වත් ශුද්ධ බයිබලය උඩ තියන්න හොඳ නැහැ. වෙන ම තැනක, පිරිසිදු ව මල් තියලා, පහනක් තියලා, තියන්න ඕනේ. අපිත් එහෙම කරමු.

මල්ලී :- ශුද්ධ බයිබලය මෙච්චර ලොකු පොතක් වුණේ කොහොමද අක්කේ?

අක්කා :- ශුද්ධ බයිබලයේ ගැලවීමේ ඉතිහාසය පිළිබඳ ව තොරතුරු ඇතුළත් වෙනවා. එය හරියට පුස්තකාලයක් වගේ මල්ලි; එහි පොත් 73ක් තියනවා. එය **පැරණි ගිවිසුම** හා **නව ගිවිසුම** යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදන්නත් පුළුවන්.

මල්ලී :- ඇයි අක්කේ, එහෙම කොටස් දෙකක් තියෙන්නේ?

අක්කා :- පුරාණ ගිවිසුමේ ක්‍රිස්තුන් වහන්සේ ඉපදීමට පෙර යුගය ගැන විස්තර තියනවා. නව ගිවිසුමේ සඳහන් වන්නේ ක්‍රිස්තුන් වහන්සේ හා මුල් සභාව පිළිබඳව යි. දෙවියන් වහන්සේ ඓතිහාසික සිදුවීම් ආදිපිතෘවරුන් හා දිවැසිවරුන් මගින් අනාවරණය වූ ආකාරය පැරණි ගිවිසුමේ අන්තර්ගත වෙනවා. එහි පොත් 46ක් තිබෙනවා. නව ගිවිසුමේ සඳහන් වන්නේ, ක්‍රිස්තුන් වහන්සේ තුළින් දෙවියන් වහන්සේගේ අනාවරණයේ පූර්ණත්වය සිදු වූ ආකාරය යි. ඔවුන් වහන්සේ කරණ කොට ගෙන මිනිස් සංහතියට ම ගැලවීම උදා වූ ආකාරයත් එහි ඇතුළත් වෙනවා. නව ගිවිසුමේ පොත් 27ක් ඇතුළත් වෙනවා. එය අවුරුදු 1000කටත් වැඩි කාලයක් තුළ කතුවරුන් ගණනාවකගේ දායකත්වයෙන් ලියා තියනවා.

මල්ලී :- එතකොට ශුද්ධ බයිබලය බොහොම වටිනා පොතක් නේද?

අක්කා :- ඔව්, කිතුනු අපගේ ජීවිතයේ **විශ්වාසයේ හා බලාපොරොත්තුවේ පදනම වන්නේ ශුද්ධ බයිබලය** යි. ඒ නිසා සැම කිතුනු නිවසක ම **ශුද්ධ බයිබලය** තියෙන්න ඕනේ.

## ශුද්ධ බයිබලය

### පැරණි ගිවිසුම

1. උත්පත්ති
2. නික්මයාම
3. ලෙවී ව්‍යවස්ථාව
4. ගණන් කථාව
5. ද්විතීය නීති සංග්‍රහය
6. ජෝෂුවා
7. විනිශ්චයකාරයෝ
8. රූත්ගේ කථාව
9. 1 සාමුවෙල්
10. 2 සාමුවෙල්
11. 1 රාජාවලිය
12. 2 රාජාවලිය
13. 1 වංශාවලිය
14. 2 වංශාවලිය
15. එස්රා
16. නෙහෙමියා
17. එස්තර්
18. ජෝබ්
19. ගීතාවලිය
20. හිතෝපදේශ
21. ධර්මදේශකයා
22. ප්‍රේම ගී
23. යෙසායා
24. ජෙරමියා
25. විලාප ගී
26. එසකියෙල්
27. දානියෙල්
28. හොසියා
29. ජෝවෙල්
30. ආමොස්
31. ඔබදියා
32. ජෝනා
33. මීකා
34. නාහුම්
35. හබක්කුක්
36. ශෙපනියා
37. හග්ගයි
38. සෙකරියා
39. මලාකි
40. තෝබිත්
41. ජුදිත්
42. සලමොන්ගේ ප්‍රඥාව
43. උපදේශකයා (සිරාක්)
44. බාරුක්
45. 1 මකබිවරු
46. 2 මකබිවරු

### නව ගිවිසුම

1. ශු. මතෙව්
2. ශු. මාක්
3. ශු. ලූක්
4. ශු. ජොහන්
5. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා
6. රෝම
7. 1 කොරින්ති
8. 2 කොරින්ති
9. ගලාති
10. එපීස
11. පිලිප්පි
12. කොලොස්සි
13. 1 තෙසලෝනික
14. 2 තෙසලෝනික
15. 1 තිමෝති
16. 2 තිමෝති
17. තීතස්
18. පිලමොන්
19. හෙබ්‍රෙව්
20. ජාකොබ්
21. 1 පේදුරු
22. 2 පේදුරු
23. 1 ජොහන්
24. 2 ජොහන්
25. 3 ජොහන්
26. ජුද්
27. එළිදරව්ව

**ක්‍රියාකාරකම**

1. ශුද්ධ බයිබලයේ ප්‍රධාන කොටස් **දෙක** නම් කරන්න.
2. පැරණි ගිවිසුමේ පොත් **හතරක්** නම් කරන්න.
3. නව ගිවිසුමේ ශුභාරංචි **හතර** නම් කරන්න.
4. ශු. බයිබලයේ උත්පත්ති පොත පෙරළා එහි මුල සඳහන් වන හැඳින්වීම කියවන්න.

**පැවරුම**

- ඔබේ නිවසේ ඇති ශුද්ධ බයිබලය ගෞරවාන්විත ව වැඩම කර තැබීමට සුදුසු ස්ථානයක් සූදානම් කරන්න.
- දිනපතා පවුලේ යාච්ඤාවේ දී බයිබලයෙන් කොටසක් කියවා භාවනා කිරීමට පුරුදු වන්න.



**ජීවිතයට බිඳක්**

***දේව වචනය මනසට හා හදවතට ඇතුළුකර ගනිමු; අදහා ගනිමු; නමස්කාර කරමු. අපි දේව වචනය අනුව ජීවත් වෙමු.***